## සාරාංශය

ශ්‍රී ලංකාවේ පහත රට තෙත් කලාපයේ කුඹුරු විවිධ හේතු නිසා පුරන් වීම සහ වෙනත් පරිහරණයන්ට යොදා ගැනීම සුලභව දක්නට ලැබේ. මේ සඳහා සමාජ ආර්ථික හේතු මෙන් ම භූමියේ ඇති සීමාකාරී සාධක ද බලපා ඇත. සීමාකාරී සාධක සහ ඒවායේ මට්ටම් විවිධ නිසා කුඹුරු වලින් ලැබෙන අස්වැන්න ද විවිධ වේ. එම අස්වැන්න ලැබීමට යෙදිය යුතු පිරිවැය ද වෙනස් වේ. සීමාකාරී සාධක අනුව කුඹුරු සඳහා ශක්‍යතා වර්ගීකරණයක් නොමැති නිසා මෙවැනි වර්ගීකරණයකින් වී වගාවට වැඩි ශක්‍යතාවයක් ඇති කුඹුරු හඳුනා ගැනීමටත්, කුඹුරු පුරන් ව ඇත්නම් ඒ සඳහා බලපාන්නේ සීමාකාරී සාධක ද එසේ නොමැති නම් සමාජ ආර්ථික සාධක ද යන්න පැහැදිලිව හඳුනාගැනීමටත් හැකියාව ලැබේ. එබැවින්, කුඹුරු පුරන්වීමට බලපාන සීමාකාරී සාධක හා සමාජ ආර්ථික සාධක හඳුනා ගැනීමත්, එම සීමාකාරී සාධක පදනම් කර කුඹුරු වර්ගීකරණය කළ හැකි ක්‍රමවේදයක් සකස් කිරීමත්, එය භාවිතා කර තෝරා ගත් කුඹුරු වර්ගීකරණය කිරීමත්, මෙම අධ්‍යයනයෙන් අරමුණු කරන ලදී. නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ නියෝජනය වන ලෙස කැස්බෑව, හෝමාගම හා පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල යාය තුනක් තෝරා සීමාකාරී සාධක අටක් භාවිතා කර වර්ගීකරණය කරන ලදී. මෙම සාධක වල ප්‍රබලත්වය අනුව එකේ සිට සිව්වැනි පන්තිය දක්වා යාමේ දී ශක්‍යතාව අඩුවන ආකාරයට කුඹුරු පන්තින් හතරකට වර්ගීකරණය කෙරිණි. යායවල් තුනෙහි ම අහඹු නියදීමේ ක්‍රමවේදය භාවිතා කොට මුළු ගොවින්ගෙන් 60% ක් නියෝජනය වන පරිදි ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතා කරමින් සාමාජ ආර්ථික සමීක්ෂණයට දත්ත ලබා ගන්නා ලදී.

කැස්බෑව යායේ සිමාකාරී සාධක දෙකක් අනුව පන්තින් තුනකට වර්ගීකරණය කෙරිණි. හෝමාගම යායේ සාධක හතරක් හඳුනාගෙන පන්තින් දෙකකට බෙදන ලදී. පාදුක්ක යායේ සාධක හතරක් හඳුනාගෙන පන්තින් හතරකට බෙදා වෙන් කෙරිණි. අධ්‍යයනය සිදු කළ යායන් හි වැඩි ප්‍රදේශයක් වී වගාවට ශක්‍යතාවය වැඩි පළමු පන්තියේ කුඹුරු වේ. නියැදියේ කුඹුරු වැඩි ප්‍රමාණයක් අක්කරයට වඩා අඩු ය. වැඩි කුඹුරු ප්‍රමාණයක් තනි අයිතිය යටතේ පවතී. පවුලේ ආදායම හා වී වගාව අතර ප්‍රතිලෝම සම්බන්ධයක් ඇත. කුඹුරු ගොඩ කිරීමට හෝ විකිණීමට භූමියෙහි මුල්‍ය වටිනාකම ඉහළ යාම ද හේතු වී තිබේ. කුඹුරු වගා නො කිරීමට ප්‍රධාන හේතුවක් ලෙස පවුලේ සහ කුලී ශ්‍රමය ලබා ගැනීමේ ගැටලුව හඳුනාගන්නා ලදී. වගා නො කරන කුඹුරු ඵලදායි භාවිතයන් සඳහා යොමු කිරීම අඩු ය. පළමු පන්තියේ කුඹුරුවලින් 44% හා දෙවන පන්තියේ කුඹුරු වලින් 64% වගා නො කරයි.

මෙම ශක්‍යතා වර්ගීකරණය ප්‍රායෝගිකව භාවිතා කල හැකි වේ. මෙම වර්ගීකරණය විශාල ප්‍රදේශයකට යොදා ගැනීම තුළින් කුඹුරු වල ඵලදායීතාවය වර්ධනය කිරීමත්, ශ්‍රම ගැටලුව අවම කිරීම සඳහා යන්ත්‍රෝපකරණ භාවිතය ප්‍රචලිත කිරීමත් සුදුසු වේ.